## 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම (Recovery Plan for Learning Loss - 2022)

### - 10 ශ්‍රේණිය (සංස්කෘත)

(10 ශ්‍රේණියේ පළමු වාරයේ කාලච්ඡේද 13ක් ද දෙවන හා තෙවන වාරවල කාලච්ඡේද 18ක් ද බැගින් කාලච්ඡේද 49ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | 011 | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| **10 ශ්‍රේණිය පළමු වන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම්** | | | | | | |
| 1 | 1.2, 1.4, 1.5 | ස්වර අක්ෂර මාලාව හඳුනාගෙන භාවිත කරයි.<br>දේවනාගරී අක්ෂර ලියන පියවර හඳුනාගෙන භාවිත කරයි.<br>සංයුක්තාක්ෂර හඳුනාගෙන නිවැරැදි ව භාවිත කිරීමේ හැකියාව ලබයි.<br>සංයුක්තාක්ෂර සහිත ඡේද කියවීමේ හැකියාව ලබයි. | ▪ දේවනාගරී අක්‍ෂර ලිවීම<br>▪ සරල සංයුක්තාක්‍ෂර ලිවීම හා කියැවීම<br>▪ දේවනාගරී අක්‍ෂර සහිත වචන ලිවීම හා කියැවීම. | නිපුණතාව 1 | | 04 |
| 2 | 2.1, 2.3 | නාමපදවල වචනත්‍රයක් ඇති බව අවබෝධ කරගෙන භාවිත කරයි.<br>සංස්කෘත භාෂාවේ හා මාතෘ භාෂාවේ ලිංග භේදයන් අතර ඇති වෙනස පෙන්වා දෙයි.<br>පුරුෂ ලිංග, ස්ත්‍රී ලිංග, නපුංසක ලිංග පද වෙන් වෙන් ව ප්‍රකාශ කරයි. | සංස්කෘත භාෂාවේ හා මාධ්‍ය භාෂාවේ වචනවල ලිංග භේදයෙහි ඇති විශේෂතා පිළිබඳ පැහැදිලි කිරීම.<br><br>සංස්කෘත භාෂාවේ හා මාධ්‍ය භාෂවේ ලිංග භේදයෙහි ඇති විශේෂතා පැහැදිලි කිරීම. | නිපුණතාව 2 | | 04 |
| 3 | 3.1, 3.3, 3.4 | • නාම හා නාමපද අතර ඇති වෙනස පැහැදිලි කරයි.<br>• පුරුෂ ලිංග හා ස්ත්‍රී ලිංග ශබ්ද මුල් විභක්ති හතරෙහි වරනැගෙන අයුරු සහ අර්ථ ගැන්වෙන අයුරු අවබෝධ කරගෙන භාවිත කරයි.<br>• ලට් - ලඞ් ආඛ්‍යාත වාක්‍යයන්හි යෙදීමේ හැකියාව ලබයි. | විභක්ති යනු කුමක් දැයි පැහැදිලි කරදීම අකාරාන්ත, ඉකාරාන්ත, උකාරාන්ත පුල්ලිංග හා ආකාරාන්ත, ඉකාරන්ත, උකාරාන්ත ස්ත්‍රී ලිංග ශබ්දවල ප්‍රථමා, ද්විතීයා, තෘතීයා විභක්තිත්‍රය ඉගැන්වීම. ලට්, ලඞ් ලකාරවල පරස්මෛපද ප්‍රත්‍යය හා වරනැගීම් හඳුන්වාදීම. | නිපුණතාව 3 | | 05 |
| | | | | | | 13 |
| **10 ශ්‍රේණිය දෙවන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම්** | | | | | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | 011 | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| 4 | 4.1, 4.2 | • සංස්කෘත සන්ධි පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් ලබාගනියි.<br>• ස්වර සන්ධියේ මූලික ලක්ෂණ විස්තර කරයි.<br>• පාඨයක ඇති සන්ධිපද විසන්ධි කොට අර්ථ තේරුම් ගැනීමේ හැකියාව ලබයි. | ▪ සංස්කෘත භාෂාවේ සන්ධිවලට හිමි ස්ථානය පිළිබඳ ව හඳුන්වාදීම<br>▪ ස්වර සන්ධියේ මූලික ලක්ෂණ පැහැදිලි කරදීම. | නිපුණතාව 4 | | 08 |
| 5 | 5.1, 5.2 | • උක්තපද නිවැරදි ව ප්‍රථමා විභක්තියෙන් යොදා භාවිත කරයි.<br>• පුරුෂත්‍රයට අනුව උක්තාඛ්‍යාත යොදා නිවැරදි ව වාක්‍ය නිර්මාණය කරයි.<br>• කර්මපද හඳුනාගෙන වාක්‍යයන්හි යොදයි.<br>• අකාරාන්ත පුරුෂ ලිංග නාමපදවලට චතුර්ථී, පඤ්චමී, ෂෂ්ඨී, සප්තමී විභක්ති ප්‍රත්‍ය යොදා පද නිර්මාණය කරයි. | ◆ උක්තය යනු කුමක් දැයි හඳුන්වා එය ප්‍රථමා විභක්තියෙන් පමණක් යෙදෙන බව පැහැදිලි කරදීම<br>◆ ලට් වර්තමාන කාල ආඛ්‍යාත ප්‍රත්‍යය හා එම ප්‍රත්‍යය එකතු වී ආඛ්‍යාත ගොඩ නගාගන්නා අයුරු සරල ධාතූන් මගින් පැහැදිලි කරදීම<br>◆ උක්ත, කර්ම, ආඛ්‍යාත සහිත සරල වාක්‍ය ගොඩ නැගීම. | නිපුණතාව 5 | | 10 |
| | | | | | | 18 |
| **10 ශ්‍රේණිය තෙවන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම්** | | | | | | |
| 6 | 6.1, 6.2 | • පුරුෂ ලිංග ශබ්ද හඳුනාගන්නා අයුරු පෙන්වා දෙයි.<br>• පුරුෂ ලිංග, ස්ත්‍රී ලිංග, නපුංසක ලිංග ශබ්ද වරනැගීමේ හැකියාව ලබයි.<br>• පුරුෂ ලිංග ශබ්ද හා ස්ත්‍රී ලිංග ශබ්ද වරනැගීමේ ඇති වෙනස්කම් පෙන්වා දෙයි.<br>• වරනැගූ පද විභක්ති අනුව අර්ථ ගැන්වීමේ හැකියාව ලබයි. | ▪ සංස්කෘත නාම වරනැගිල්ලෙහි බාල, කවි, සාධු, මාලා, මති, ධෙනු, ඵල, ශබ්ද වරනැගීම. | නිපුණතාව 6 | | 08 |
| 7 | 7.1, 7.3, 7.4 | • සරල සංස්කෘත කෘති තනි ව අධ්‍යයනය කිරීමේ හැකියාව ලබයි. | ▪ බුද්ධ ගද්‍යයේ මුල් ශ්ලෝක පහ (5) කියැවීමට හුරු කරවීම. | නිපුණතාව 7 | | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | 0<br>1<br>1 | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | | • සරල සංස්කෘත ශ්ලෝක ගායනය කිරීමේ හැකියාව ලබයි.<br>• දේවනාගරී අක්ෂර භාවිතයෙන් ශ්ලෝක ලියා දක්වයි. | ▪ ව්‍යාසකාරයෙන් තෝරාගත් සරල ශ්ලෝක හයක් (06) මතකයෙන් කීම සහ අර්ථාවබෝධය ඇති කරගැනීම.<br>▪ ඉහත කෘතිවල තෝරාගත් ශ්ලෝක කිහිපයක් දේවනාගරී අක්ෂරයෙන් ලිවීමට හුරු කරවීම. | | | |
| 8 | 8.1, 8.2 | • උපදේශ සාහිත්‍යය පිළිබඳ අවබෝධය ලබයි.<br>• සංස්කෘත උපදේශ සාහිත්‍යය හඳුනාගෙන විස්තර කරයි.<br>• හිතෝපදේශය හා පඤ්චතන්ත්‍රය ආශ්‍රිත උපදේශ උගනියි.<br>• පඤ්චතන්ත්‍රයේ සහ හිතෝපදේශයේ අන්තර්ගත ගද්‍ය පද්‍ය පාඨ නිවැරැදි ව ශබ්දනගා කියවයි. | ▪ උපදේශ කථා සාහිත්‍ය පිළිබඳ මැනවින් හඳුන්වාදීම.<br>▪ හිතෝපදේශ, පඤ්චතන්ත්‍ර යන ග්‍රන්ථ දෙක පිළිබඳ සරල අවබෝධයක් ලබා දෙයි. | නිපුණතාව 8 | | 05 |
| | | | | | | 18 |
| | | | | සමස්ත එකතුව | | 49 |

## 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම (Recovery Plan for Learning Loss - 2022)

### - 11 ශ්‍රේණිය (සංස්කෘත)

(11 ශ්‍රේණියේ පළමු වාරයේ කාලච්ඡේද 13ක් ද දෙවන හා තෙවන වාරවල කාලච්ඡේද 18ක් ද බැගින් කාලච්ඡේද 49ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| **11 ශ්‍රේණිය පළමු වන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම්** | | | | | | |
| 1 | 1.1, 1.3 | • සංයුක්තාක්ෂරයක් යනු කුමක් ද යි පැහැදිලි කරයි.<br>• හල් අකුරු යොදා ලියූ පද සංයුක්තාක්ෂරවලින් ලියයි.<br>• වෙන් වෙන් ව දෙන ලද ව්‍යඤ්ජන සංයෝග කොට දක්වයි.<br>• සංයුක්තාක්ෂර සහිත පාඨයක් කියවන විට ලියයි. | **සමාන අකුරු බැඳෙන අයුරු පෙන්වාදීම**<br>▪ සරල සංයුක්තාක්ෂර සහිත වචන ලිවීම<br>▪ ස්වර, ව්‍යඤ්ජන, හ්‍රස්ව දීර්ඝ, වර්ගාක්ෂර, අනුනාසිකාක්ෂර, ඝෝෂ, අඝෝෂ අන්තඃස්ථාක්ෂර, ඌෂ්මාක්ෂර අනුස්වාරය, විසර්ගය වෙන් වෙන් ව ප්‍රකාශ කරයි. | නිපුණතාව 1 | | 04 |
| 2 | 2.2 | ◆ දෙන ලද ඡේදයක අන්තර්ගත පූර්ව ක්‍රියා සහ තුමන්තක්‍රියා වෙන් කොට දක්වයි.<br>◆ දෙන ලද කෘදන්තපද වර්තමාන, අතීත වශයෙන් වෙන් කොට දක්වයි.<br>◆ පූර්ව ක්‍රියා හා තුමන්ත ක්‍රියා යොදා වාක්‍ය සාදයි. | ▪ පූර්වක්‍රියා, තුමන්තක්‍රියා සාධනය පිළිබඳ අවබෝධයක් ලබාදීම.<br>▪ ධාතුවකින් පර ව ප්‍රත්‍යය වීමෙන් සෑදෙන කෘදන්තපද හඳුන්වාදීම. (ගච්ඡන්, ගතඃ, මෘතඃ) | නිපුණතාව 2 | | 05 |
| 3 | 3.1 | ◆ දෙන ලද වාක්‍යවල අන්තර්ගත විභක්ති ප්‍රයෝග හඳුනාගනියි. | ▪ ගමනාර්ථයේ ද්විතීයා, සාර්ධම් යෝගයේ තෘතීයා, පිණිසාර්ථයේ චතුර්ථී කාලාර්ථයේ සප්තමී ආදි විභක්ති ප්‍රයෝග සහිත වාක්‍ය තැනීමට හුරු කරවීම. | නිපුණතාව 3 | | 04 |
| | | | | | | **13** |
| **11 ශ්‍රේණිය දෙවන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම්** | | | | | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| 3 | 3.3 | I, IV, VI, X යන ධාතු ගණ ලට්, ලඞ් පරස්මෛපදවල වරනගයි.<br>වර්තමාන කාල ආඛ්‍යාත අතීත කාලයට හරවයි.<br>දෙන ලද වාක්‍යවල විභක්ති ප්‍රයෝග හඳුනා ගෙන ලියයි. | ▪ ලට්, ලඞ් යන ලකාරයන්හි පරස්මෛපද ආඛ්‍යාත රූප නිවැරදි ව වරනැගීම හා ආඛ්‍යාත පදවල වචන භේදය හා පුරුෂ භේදය හඳුනාගෙන තේරුම කීම. | නිපුණතාව 3 | | 04 |
| 4 | 4.1,4.2 | • ව්‍යඤ්ජන සන්ධි සිදුවන ක්‍රම පැහැදිලි කරයි.<br>• විවිධ ව්‍යඤ්ජන සන්ධි රීති අනුව පද යුගල සන්ධි කිරීමේ අභ්‍යාසයන්හි යෙදෙයි.<br>• ව්‍යඤ්ජන සන්ධි පද විසන්ධි කරයි.<br>• භාෂාවේ විසර්ග සන්ධි පද යෙදෙන අයුරු උගනියි. | ව්‍යඤ්ජන සන්ධි ප්‍රභේද හඳුනාගැනීම.<br>විසර්ග සන්ධියේ ප්‍රභේද හඳුනාගැනීම. | නිපුණතාව 4 | | 07 |
| 5 | 5.1, 5.2 | • දෙන ලද සරල කර්තෘකාරක වාක්‍යයන්හි ප්‍රථමා විභක්ති ගත් කර්තෘපද තෘතීයා විභක්තියට හැරවීමේ අභ්‍යාසයක යෙදෙයි.<br>• කර්මය හඟවන පදය ප්‍රථමා විභක්තියට හැරවීමේ අභ්‍යාසයක යෙදෙයි.<br>◆ දෙනු ලබන සරල කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයට හරවයි. | ▪ කර්තෘකාරක වාක්‍යයක් කර්මකාරකයට හැරවීමේ දී **කර්තෘ** තෘතීයා විභක්ති ගන්නා අතර **කර්මය** උක්ත වන බවත්, උක්තය ප්‍රථමාවිභක්තියෙන් තැබිය යුතු බවත්, අවබෝධ කරදීම.<br>▪ කර්තෘකාරක - කර්මකාරක වාක්‍ය ඇතුළත් පාඨයක් අධ්‍යයනය කොට වාක්‍ය රටාව හඳුනාගැනීම හා භාවිතයට ගැනීම | නිපුණතාව 5 | | 07 |
| | | | | | | 18 |
| **11 ශ්‍රේණිය තෙවන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම්** | | | | | | |
| 6 | 6.1, 6.2 | • ලිංගත්‍රයට අයත් නාමපද නම් කරන ලද විභක්තිය වරනගා වෙනස්කම් හඳුනාගැනීමේ අභ්‍යාසයක යෙදෙයි<br>◆ ගුරුවරයා විසින් නිර්දිෂ්ට කරනු ලබන නාමපද සම්පූර්ණයෙන් වරනගා දක්වයි. | ▪ පුල්ලිංග, ස්ත්‍රීලිංග හා නපුංසකලිංග ස්වරාන්ත නාමපද අතුරින් දුෂ්කර හා අක්‍රමවත් පද තෝරාගෙන ඒවා වරනැගීම පිළිබඳ අවබෝධ කරදීම (උදා: සඛි, ගන්තෘ, වධූ) | නිපුණතාව 6 | | 06 |
| 7 | 7.1, 7.2 | • සංස්කෘත සාහිත්‍යය තුළ ශතක ග්‍රන්ථ දරන ස්ථානය අවබෝධ කරගනියි. | ▪ සංස්කෘත සාහිත්‍ය තුළ ශතක ග්‍රන්ථ දරන ස්ථානය අවබෝධ කරදීම. | නිපුණතාව 7 | | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | | • නීතිශතකය හා ව්‍යාසකාරයේ ඇතුළත් අධ්‍යාපනයේ වටිනාකම දැක්වෙන ශ්ලෝක එකතුවක් සකස් කරයි.<br>• තෝරාගත් පද්‍යවල අර්ථ පැහැදිලි කරයි. | ▪ නිර්දිෂ්ට ශතක ග්‍රන්ථවලින් තෝරාගත් කොටස් අධ්‍යයනය කොට අර්ථ විවරණය කරදීම.<br>▪ ඛණ්ඩ කාව්‍ය ලක්‍ෂණ පිළිබඳ හැඳින්වීමක් කිරීම. | | | |
| 8 | 8.1, 8.3 | • තමා අවට පරිසරයේ සමු වන භෞතික සම්පත් නම් කරයි; රූපසටහන් මගින් ඉදිරිපත් කරයි.<br>• සදුපදේශ පුවරු සකස් කොට පාසලේ/පිරිවෙනේ ප්‍රදර්ශනය කරයි.<br>◆ සදුපදේශ සංග්‍රහයක් සම්පාදනය කරයි. | ▪ අධ්‍යාපනික ස්ථානයේ සහ පදිංචි ස්ථානයේ උපකරණ, වෘක්‍ෂලතා, සත්ත්වයන්, අංගප්‍රත්‍යංග සංස්කෘතයෙන් නම් කිරීම<br>▪ ශිෂ්‍ය සමිතියෙහි හා වෙනත් මහජන ඇමතුම්වල දී සංස්කෘතයෙන් ම හෝ උද්ධෘතයන් ආශ්‍රයෙන් කතා පැවැත්වීමට හුරු කරවීම. | නිපුණතාව 8 | | |
| | | | | | | 18 |
| | | | | සමස්ත එකතුව | | 49 |